දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல ) FV/SA/SV/C/02/2011(III)
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2016.12.08
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
**Ministry of Health, Nutrition& Indigenous Medicine**

චක්‍රලේඛ අංක : 01-69/2016

රේඛීය අමාත්‍යංශය යටතේ ඇති සියලු රෝහල් හා සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

## වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2016

මුදල් රෙගුලාසි 756 හා 770 ප්‍රකාරව හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 05/2016 හි උපදෙස් පරිදි සෑම රාජ්‍ය ආයතනයක්ම 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කොට වාර්තා ඉදිරිපත් කළයුතු මෙයින් දන්වා සිටිමි.

02. ඒ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 05/2016 මගින් ප්‍රාදේශීය කාර්යාල සහිත දෙපාර්තමේන්තු සඳහා පෙර පැවති කාලයට වඩා වැඩි කාලයක් සමීක්ෂණ කටයුතු නිම කිරීම සඳහා ලබා දී ඇති බව දන්වන අතර එම කාලය තුළ පොදු භාණ්ඩ, වාහන හා ශල්‍ය භාණ්ඩ වෙන වෙනම සමීක්ෂණ කටයුතු නිම කොට වාර්තා කළයුතු බව අවධාරණය කරමි. අදාළ කාල රාමුව පහත දක්වමි.

I. 2016.12.15 දිනට පෙර සමීක්ෂණ මණ්ඩල නම් කොට එවා අනුමැතිය ලබා ගැනීමට කටයුතු ගත යුතු ය.

II. 2017.03.15 දිනට පෙර 2016 වර්ෂයට අදාළ සමීක්ෂණ කටයුතු භෞතික පරීක්ෂා කිරීම් අවසන් කළයුතුය.

III. 2017.03.31 දිනට පෙර 2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමීක්ෂණ මණ්ඩල වෙතින් ලබා ගැනීම.

IV. 2017.04.15 දිනට 2016 සමීක්ෂණයෙන් අනාවරණය වී ඇති ඌණතා හා අතිරික්ත වාර්තා කිරීම හා ක්‍රියා මාර්ග ගැනීම.

V. 2017.04.30 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව සුදුසු පරිදි අපහරණ කටයුතු සිදු කිරීම.

VI. 2017.06.15 දිනට පෙර 2016 වර්ෂයට අදාළ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළයුතුය. (විගණකාධිපතිවරයාගේ පිටපත මෙම අමාත්‍යාංශයේ රජයේ විගණන අංශයට යැවිය යුතු අතර එම වාර්තා යවන ආවරණ ලිපියේ පිටපතක් මාවෙතද එවිය යුතුය)

03. 2016 වර්ෂය තුළ භාණ්ඩ මිලදී ගැනීම් හා අපහරණය කරන ලද වත්කම් තොරතුරු රාජ්‍ය මුදල් චක්‍රලේඛ 422 හි ඇමුණුම් ප්‍රකාරව අදාළ තොරතුරු රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම සඳහා 2017.04.30 ට පෙර ගණකාධිකාරී - මුදල් ඇස්තමේන්තු වෙත එවීමට කටයුතු කළ යුතුය.

04. මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම අනුව සමීක්ෂණ මණ්ඩල හා අපහරණ මණ්ඩල පත්කර අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළයුතුය.

05. නියමිත කාල රාමුව තුළ සමීක්ෂණ කටයුතු සිදු නොකිරීම හා විගණකාධිපති වෙත සමීක්ෂණ වාර්තා නොයැවීම විගණන විමසුම් වලට බඳුන්ව ඇත. ඉහත උපදෙස් අනුව කටයුතු නොකරණ නිලධාරීන් විගණන විමසුම් වලට රාජ්‍ය ගිණුම් කාරක සභාවට පෞද්ගලිකව වගකිව යුතුය.

06. ඔබ විසින් සමීක්ෂණ වාර්තා එවීමේදී පොදු භාණ්ඩ හා ශල්‍ය භාණ්ඩ වලට අදාළව සමීක්ෂණය කරන ලද අංශ වල ලැයිස්තුවක්ද සමීක්ෂණ වාර්තා සමඟ ඉදිරිපත් කළයුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් විස්තර අවශ්‍ය නම් ප්‍රධාන ගණකාධිකාරී (භාණ්ඩ සමීක්ෂණ) වෙතින් ලබා ගත හැකි දුරකථන අංක 011-2667903 මඟින් විමසීම් කළහැක.

අනුර ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අනුර ජයවික්‍රම,
ලේකම්,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.